ලංකාවිත්ති
LANKA VITHTHI




LANKA VITHTHI
P. O. BOX 64678
LONDON NW3 9LS
ENGLAND

*Phone* : **020 74289388**
*Fax* : **0871 9005163**
E-mail : **lanka.viththi @ virgin.net**



කර්තෘ : දයා ආනන්ද රණසිංහ
*Editor* : **Daya Ananda Ranasinghe**
චිත්‍ර : චන්දන සෙනෙවිරත්න
*Art* : Chandana Seneviratna
පරිගණක කටයුතු : චන්න කබ්රාල්
*Computer Graphics* : Channa Cabraal
ඡායාරූප : ආනන්ද කාරියවසම්
*Photography* : Ananda Kariyawasam

# සතුට හොරු අරන් ගිය හැටි!

**මෑ**ත ඉතිහාසයේ අපේ රටේ වූ භයානකම යුද්ධය පසුගිය මැයි 18 වනදා අවසාන විය. අවුරුදු 30 කට ආසන්න කාලයක් එය අපේ ජන ජීවිත, අපේ රටේ ධනය, දේපළ ආදී සියළු වටිනාකම් විනාශ කළාය. එය කිසිසේත් දිනන්නට බැරි යුද්ධයක් ලෙසත්, ශ්‍රීලංකාව පරිහානියට පත් දේශයක් ලෙසත් සලකා ඉතා **අවාසන්වන්ත රට** යන ලේබලය අලවා තිබිය දී නොසිතුවිරූ අන්දමින් ඒ පරාජයන් උඩුයටිකුරුකොට, ජයග්‍රාහීව හිස ඔසවා, සිංහ ධජය යළි ගුවනේ ලෙළ දෙවන්නට අපේ විරුවන්ට හැකිවී ය. ඒ ජයග්‍රහණයේ වටිනාකම මුදලින් මිළකරන්නට නොහැකි ය. ග්‍රන්ථ සීයක් ලියා හෝ එහි ආනුභාවය වචනයෙන් විස්තර කළ නොහැකිය. ඒ ජයග්‍රහණය උදෙසා දහස් ගණනක් ජීවිත පරිත්‍යාග කළෝය. දහස් ගණනක් ආබාධිතයෝ වූහ. ඒ නිසාම ඒ යුද ජය අද ජිවතුන් අතර සිටින අප ජනතාවගේ ජීවිතයේම කොටසක් බවට පත්විය. ඒ දිනුදා අප රට ඇළලී ගිය සැනසුම් සුසුම අකනිටා බඹලොව දක්වා දැනෙන්ට ඇතැයි සිතමි. ප්‍රීති ඝෝෂා විශ්වයේ එහා කෙළවරටම නින්නාද වූයේය. එවැනි ආශ්වයයීයක් අපේ ජිවිත කාලය තුළදී දක්නට හැකිවීම ගැන අපි අඩම්බරවීමු. සොම්නසින් කතා කළෙමු. කිරිබත් පිසූහ. කිරිබත් එකිනෙකාට කැවූහ. නැටූහ. ගැයූහ. ඒ සියළු ජය අප එකාමෙන් සමගි සම්පන්නව ඒකරාශීව ඒ ජයග්‍රහණය උදෙසාම සියළු දුෂ්කරතා විඳගෙන මුහුණ දුන් නිසාමය.

ජයග්‍රහණයෙන් මාස හයක් ඉකුත් වූ අද මේ සිදුවන්නේ කුමක්ද? මේ අප බලාපොරොත්තු වූ දෙයක්ද. ඒ ස්වර්ණමය ජයග්‍රහණය පිත්තල කෑල්ලකක තත්වයට ඇද දමන්නට දැන් උත්සාහයක් ගන්නේ ඒ දිනුමට ඉහළම දායකත්වයක් දුන් තැනැත්තාමවීම තරම් තවත් නින්දාවක් කොහි වේත්ද? ඊටත් වඩා ත්‍රස්තවාදීන් මර්ධනය කළ හමුදා නායකයෙකු මාස හයකට පසු ඒ ඉතුරු ත්‍රස්තවාදීන්ගෙන් ආධාර ඉල්ලන්ට තරම් දීනවීම කොපමණ විළි ලැජ්ජා නැති කමක්ද? එවැන්නක් ලොව කිසිම රටක හමුදා නායකයෙකු කළ බවට සඳහනක් කොහි වත් අසන්නටවත් දකින්නටවත් නැත.

යුද්ධය කෙරීගෙන යන සමයේ පිටත හා අභ්‍යන්තර සතුරන්ගෙන් අඩුවක් නොවීය. පිටත සිටි විදේශීය සතුරෝ ත්‍රස්තවාදීන්ගේ පැත්තගෙන යුද්ධය නවතන්නටද, සාම හමුදාවක් අප රටට එවන්නටද, අපේ නායකයන් හා හමුදා නිළධාරීන් යුද අපරාධ සඳහා විනිශ්චය කරවන්නටද දැඩි මහන්සියක් ගත්හ. අභ්‍යන්තරයේ සිටින දේශීය සතුරෝ ජනතාව කුළප්පු කරමින් හමුදාවේ චිත්ත ධෛර්‍යය බිඳින්නටද, හමුදා ජයග්‍රහණයන්ට නින්දා වන අයුරින් ප්‍රකාශයන් කරන්නටද වූහ. අද ඒ දේශීය සතුරෝ හිටපු ජෙනරාල්වරයාගේ කුළුපග ම මිතුරන්ව සිටිති. ඒ කල්ලියේ කෙනෙක් කී දෙයක් යළිත් මෙහි සිහිපත් කිරීම උචිත යයි සිතමි. ඒ කියමන නම් හමුදාපතිවරයා ගැළවීමේ හමුදාවටවත් සුදුසු නැත යන්නයි. ඒ හමුදාපතිවරයා දැන් මේ කරන්නේ ඒ වචන සැබෑවක් බවට හැරවීමක් නොවේද?



ජේසු උපත - චිත්‍රය - ශ්‍රීලාල් නානායක්කාර Sri Lanka

# අසරණ සරණ සහ නත්තල

**මෙ**යට සති කීපයකට පමණ පෙර එක් සීතල අඳුරු උදයක වෙලාව අළුයම **4.30** ට පමණ මීසම් ගෘහයේ දොර සීනුව නාද විය. තද නින්දේ සිටි මම අමාරුවෙන් දෑස් පිසදා ප්‍රධාන දොර ළඟ තිබෙන කවුළුවෙන් එළියේ සිටි මිනිසාට කතා කළෙමි.

"මොකක්ද උවමනාව ?"

"මම ඊයෙ හිරෙන් නිදහස් වෙලා ආවෙ. හරි බඩගිනියි. කන්ඩ බොන්ඩ මොනව හරි දෙන්න. මම සීතලේ ගැහෙනවා. මාව ඇතුළට ගන්න......"

බන්ධනාගාරයෙන් නිදහස්වූ බවත්, ඇතුළට ගන්නට යයි කළ ඉල්ලීම නිසාත් මසිතට බයක් ඇතිවිය.

"සමාවෙන්න සහෝදරයා.... අවේලාවෙ අමුත්තන් ඇතුළට ගන්න බැහැ....?"

ඔහු සැර පරුෂ වචනයෙන් මට බැනවදින හැටි අසන්නට සැරසී සිටි මට ලැබුණු පිළිතුර වෙන එකකි. බයාදු ලීලාවෙන් යුතුව....

"කමක් නැහැ.... බොහොම ස්තුතියි.... මම ගිහින් එන්නම්...." ඔහුගේ පිළිතුර විය. ඔහු නික්ම යනු මට ඇසිණ. මිනිස් වෙසින් ඒ ආවේ ජේසුද යන්න අදත් මට හැඟෙයි. මා ප්‍රමාද වූ බව ද මට හැඟේ.

නත්තල් උත්සවයට තව දින කිහිපයකි. දෙවිපියාණන් මිනිස් වෙස් ගෙන මෙලොව උපත ලැබීම නත්තලයි. ඊශ්‍රායෙල් ජනතාවගේ නොනවතින කන්නලව්වට, යැදුමට සවන්දුන් දෙව් මහෝත්තමයාණන් වචනය තෙම මාංශගතවී මරිමච් කුසයේ ස්ප්‍රීතු සාන්තු වරමින් ජේසු රජිඳාණන් පිළිසිඳගත් බව ශුද්ධ බයිබලය සාක්ෂි දරයි

විවිධ කාල වකවානු තුළ විසූ ජනතාව අනේක විධ තාඩන පීඩන වලට ලක්ව දෙවිඳුන් අමතන සෑම අවස්ථාවකම ආදරණීය පියෙකු ලෙස උන්වහන්සේ ඔවුන්ගේ උපකාරයට පැමිණි බව බයිබලය පෙන්වා දෙයි. දේව විශ්වාසයෙන් ඈත් වූ හැම අවස්ථාවකම ආදි වක්තෘවරුන්, රජ වරුන්, දිවැසිවරුන් මගින් ජනතාව නැවත විශ්වාසයේ පිහිටුවීය. කිරියෙන් පැණියෙන් උතුරන යහපත් ආගමික සම්ප්‍රදායක් උරුම කරගනිමින් සාම කාමී ලෙස දිවි ගෙවන මෙම ජුදා ජනතාවට අසල්වැසි රාජ්‍යයන්ගෙන් ඇතිවන හිරිහැරවල අඩුවක් නොවීය. රෝම අධිරාජයාගේ පාලනයට යටවීම, ආගමික නිදහස, සාමාජීය නිදහස, සිවිල් නිදහස නැතිවීම ඔවුන්ට දරාගත නොහැකිවීය. මෙසියස් ගැළවුම්කරුවෙකු එවා ඔවුන් මේ දුකෙන් මුදවා ගන්නැයි දෙවිපියාණන්ට කළ කන්න ලව්වේ ප්‍රතිඵලයක් ලෙස ජේසු සමිඳාණන්ගේ උපත සිදුවිය. එම උපතේ ප්‍රීතිය නිමිති කොටගෙන දේව දූතයන් සුරලොව දෙවිනට මහිමයද, මෙලොව ජනයාහට සාමයද වේවායි ගැයූහ.

ජේසු උපත එඬේරුන්ට පැව සූහ. ඔවුන් ගැළවුම්කරුවාණන් බැහැ දුටහ. රජවරු එතුමන් වැඳ නමස්කාර කරන්නට පැමිණියෝය. ජනතාවගේ රජ උපත ලද බව ප්‍රකාශ කළහ. ජනරජ රජමැදුරක නොව ගවහලක උපත ලැබීම තවත් වැදගත් කරුණකි.

> ***පටු දොරටුවෙන් ඇතුල්වන්න. මක්නිසාද, විනාශයට යන දොරටුව විශාලය. පාර ද පළල්ය. එයින් ඇතුළ්වන්නෝ ද බොහෝ ය.***
>
> ***අනුන් විනිශ්චය නොකරන්න. ඔබ මනින මිම්මෙන්ම ඔබටත් මැන දෙනු ලැබේ.***
>
> ***- ශුද්ධ බයිබලය***

ජේසුතුමන්ගේ උපත සිදුවී වසර දෙදහස් ගණනක් ගතවී ඇත. සෑම වසරකම එම විශේෂ උපත කිතුණුවන් පමණක් නොව අන් සියල්ලෝද සමරති. ගෙවල් වීදි කඩපිල් අලංකාර කරති. ගවලෙන් සදති. කැරොල් ගීත අසති. ගයති. තෑගිබෝග හුවමාරු කරගනිති. එදින පල්ලිය පිරී ඉතිරී ඇත. සතුටු සිනා හඬ දසතින් ඇසෙයි. කොතරම් සුන්දරද? අගනේද?

අප අපගෙන් මෙසේ ඇසිය යුතුය. **2009** වසරේ නත්තල ආගමික කටයුතු කර කා බී, ප්‍රීති වී මෙදා නත්තල නම් හරි අගෙයි, නියමයි, ආදී වශයෙන් ආත්මාර්ථකාමී වදන් වැලක් කියා සැනසෙනවාද? නැත්නම් නත්තලේ සැබෑ අරුත වන මිනිස් වෙසින් අප වෙත පැමිණිනෙන ජේසුන් හඳුනාගෙන අපට හැකි දෙයක් ඔවුන් වෙනුවෙන් කරන්න යොමුවෙනවාද ? යන්නයි. විවිධ ප්‍රශ්න වේදනාවන් කරපින් නාගෙන මා වෙත පැමිණෙන මගේ භාර්යාව, ස්වාමිපුරුෂයා, දෙමාපියන්, දරුවන්, සමීප හිතවතුන් මෙන්ම අමුත්තන් තුළින් ජේසුන් දකින්නට මගේ හදවත විවෘතද? මගේ දෙසවන් යොමුකරන්න හැකිද ? උපකාරයක් කරන්න හැකිද ? අප ලබන සාමය සතුට අනෙක් අය සමග බෙදාහදා ගන්න සූදානම්ද? මෙය නොවෙද නත්තලේ සැබෑ අරුත ?

අපි මෙසේද යදිමු. සාමයේ රජිඳාණෙනි! අප ලක්බිමට අවැසි සාමය සතුට සැනසුම ලබාදී, එහි සෑම ජනතාවක්ම තේරුම් ගැනීමෙන් යුතුව සුහදව ජීවත්වන්නට අවැසි වාතාවරණය සකසා දුන මැනව! ආමෙන් !



♦ ***ඇන්ජලෝ විජේවික්‍රම (නි.ම.නි.) පියතුමා***
**Sacred Heart Catholic Church**
**London NW6 UK**

# ✳ නව සහශ්‍රයට ධර්මානුශාසනා ✳

## හිතෝපදේශයෙන්

**සංහති ශ්‍රේයසී පුංසාං - ස්වකුලෛරල්පකෛරපි**
**කුශෛණාපි පරිත්‍යක්තා - න පුරොහන්ති තණ්ඩුලා**

***අර්ථය*** : *පුද්ගලයන්ගේ ස්වල්ප වූද ස්වකීය කුලයන් හා එක්වීම උතුම් වන්නේය. එය එසේමයි. දහයියා වලින් තොර කරන ලද සහල් පැල නොවේ.*

තම කුල පරම්පරාව හෝ වංශපරම්පරාව හෙවත් බන්ධු (නෑදෑ) වර්ගයා කියන මේ කොයි ආකාරයකින් හෝ හඳුන්වන තම වර්ගයා හා එක්වීම වැඩදායක වන්නේ ය. එය උතුම් ක්‍රියාවක් වශයෙන් හඳුන්වා ඇත. මෙම පද්‍යයෙන් විස්තර කරන්නේ සමගියේ බලයයි. සමගිය ලොව ප්‍රමුඛ බලවේගයන්ගෙන් එකකි. එය සතුරෙකුට පහසුවෙන් පරාජය කළ හැකි නොවේ. සමගි බලය තුළින් බොහෝ දේ දිනිය හැකි ය.

හොඳම උදාහරණය ජාතක සාහිත්‍යයේ වට්ඨක ජාතකයේ එන වටුවැද්දාගේ කතාවයි. වැද්දා දැළ එලූ කල වටුවෝ කලින් කතාකරගත් පරිදි සමගිව දැල ඔසවාගෙන ගොස් ගසක රඳවා ඉන් බේරී ගියහ. ඊළඟ වතාවේ ඔවුන් අසමගිව එකිනෙකා දබර කර ගන්නට වූ විට දැල ඔසවා ගන්නට කෙනෙකු නැතිව එදා ඔවුන් වැද්දාගේ ග්‍රහණයට පහසුවෙන් අසුවිය. සියළු වටුවෝ ජීවිතක්ෂයට පත් වූහ.

සියළු දෙනාගේම කුඩා බලයන් එකට එකතු වූ තැන සතුරා වුව පරාජය කළ හැකි විශාල බලයක් ඇත්තේ ය. එය හරියටම ශක්තිමත් කඹයක් මෙනි. කඹය නිර්මාණය වී ඇත්තේ කුඩා කෙඳි වලිනි. ඒ කෙඳි එකක් බැගින් ගතහොත් පහසුවෙන් කඩා දැමිය හැකි ය. නමුත් එම කෙඳි එකට ගෙතුණු පසු එය හස්ති රාජයෙකුට වුවද කැඩිය නොහැකි ය.

මෙම පද්‍යයෙන් උගන්වන උපමාවද කදිම එකකි. වී ඇටය පොත්ත ඉවත් නොකොට පැල කළ කල්හි එය වී සපයන ගොයම් පැලයක්ව වැඩේ. එහෙත් වී පොත්ත හෙවත් දහයියා ඉවත් කර ලැබෙන සහල් ඇටය පැළ කළහොත් එය පැල නොවේ. කවදාවත් ඉන් ගොයම් ගසක් ලබාගත නොහැකි ය. නිශ්ප්‍රයෝජන ය.

මේ උපමාව මිනිසුන් සම්බන්ධයෙන් මනාව ගැලපේ. ඇතැම් අය සිතන්නේ උසස් නිලතල බලපුළුවන්කාරකම් තිබූ පමණින් කටයුතු සියල්ල සිදුවන බවයි. නමුත් එය එසේ නොවේ. එසේ පුළුවන්කාරකම් නැති පොඩි මිනිසාද ප්‍රයෝජනවත් කෙනෙකි. ඒඅය වැඩකට නැති අයසේ සලකා බැහැර කළ නොහැකිය. ඔවුන්ගෙන් ද ගත හැකි ප්‍රයෝජන එමට ය. වී ඇටයට දහයියා ද අවශ්‍ය වන්නාසේ ය.

ජාතක සාහිත්‍යයේ එන රුක්ඛධම්ම ජාතකය මේ සම්බන්ධයෙන් තවත් වැදගත් ජාතක කතාවකි. උද්‍යානයේ තැන් තැන් වල විශාල ගස් තිබුණද මහ සුළඟකදී ඒවා පහසුවෙන් ඉදිරී වැටේ. එහෙත් විශාල නොවුවද එකට වෙළී පවත්නා කුඩා ගස් වැල් ගොන්න සැඩ සුළඟකදී වුවද විනාශ කළ නොහැකි ය.

තත්වයෙන් ඉහළ නොවුවද කුඩා අය තුළද යම් ශක්තියක් ඇති බව අප අමතක කළ යුතු නොවේ. එනිසා ලොකු කුඩායයි නොබෙදා සමගිය තුළින්, ශක්තිය තුළින් බොහෝ වැඩ සාදාගත හැකි ය. එකිනෙකා අතර බෙදීම් ඇතිකරගෙන වෙන්ව ඉඳිමින් අවැඩ සාදා ගන්නවාට වඩා වෙන්වූවන් වෙත්නම් සමගියේ රැහැණින් එකට බැඳී කටයුතු කිරීමෙන් ප්‍රාර්ථනා සඵල කරගත හැකි ය. ලොව ජාතීන් වශයෙන් ද මෙම ආදර්ශය ඉතා වැදගත් වූවකි. එනිසා හැමවිටම සමගිව කටයුතු කරන්න.



**රාජකීය පණ්ඩිත - ශාස්ත්‍රපති**
♦ ***පූජ්‍ය විල්ඔය විමලජෝති හිමි***
**ලන්ඩන් බෞද්ධ විහාරය**
**The Avenue, Bedford Park,**
**London W4 1UD**


**NORMA & Co**
**Associate Solicitors**

**2 Queens Parade**
**Green Lanes, London N8 0RD**
**Tel. 020 8348 7772 / 07717173414**

**Any type of Visa Applications**
**Car Accidents**

***Colombo Office***
**Visa Applications & Any Refusals**
**100/6 Rosemead Place**
**Colombo 7**
**Tel. 2672432 / 0777686632**